**බදුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
--------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බදුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**
----------------------

සභාවේ අවසාන තොග අගයකිරීම් හා ගිණුම්ගත කිරීමේදී අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

(අ) සමාලෝචිත වර්ෂයට ගෙවිය යුතු විගණන ගාස්තු රු.25,364 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ සේවකයන්ට ගෙවූ ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂා කිරීමේ දීමනා රු.6,600 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ දී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු බෙදා නොහරින ලද රු.5,520 ක් වටිනා කසල බඳුන් ඉතිරි තොගය ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල රු. 10,917,341 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.3,365,093 ක් විය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**
-----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | සභා සීමාව තුළ පිහිටි කාමර 20 කින් යුත් හෝටලයකින් අතුරු ව්‍යවස්ථා පනවා සභාවට හිමි ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය

----------------------------------

| | | |
|---|---|---|
| (i) | 155 වන රීතිය | PS 10 ආකෘතිය ප්‍රකාරව මුදල් පොතක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) | 164 වන රීතිය | ගිණුම් ලියවිලි ලේකම්වරයා හෝ බලය පවරන ලද නිලධාරියෙකු විසින් දෛනිකව පරීක්ෂා කර නිවැරදි බවට අත්සන් යොදා නොතිබුණි. |
| (iii) | 180 වන රීතිය හා 885, පළාත් ප්‍රධාන 2010 මාර්තු 24 දිනැති අංක 2/මු/1 දරන ලිපිය | සභාවේ මුදල්, දේපල, ගබඩා ආදියේ භාරකාරත්වය මුදල් රෙගුලාසි දරන, චෙක්පත් අත්සන් කරන, වවුචර්පත් සහතික කරන ඌව ආදී වගකීම් දරන සියලුම නිලධාරීන් රාජකාරියට අදාල ලේකම්ගේ ඇප තැන්පත් කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

-----------------------------------

| | | |
|---|---|---|
| (i) | මු. රෙ.396(ඈ) | නිකුත් කර ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ රු.16,956 ක් වටිනා චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) | මු.රෙ.571 | 2016 දෙසැම්බර් 31 දිනට වසර 02 ක කාලයක් ඉක්මවූ එකතුව රු.29,950 ක් වූ තැන්පතු 13 ක් නියාදනය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආයතන XXIV වන 1:6 හා 4 වගන්තිය | ස්ථාන මාරුවී, විශ්‍රාම ලැබූ, සේවය අතහැර ගිය හා සමාජවාදී තොරතුරු සොයාගත නොහැකි නිලධාරීන්/සේවකයින් සංග්‍රහයේ 12 දෙනෙකුගෙන් සභාවට අයවිය යුතු රු.24,926 ක් පරිච්ඡේදයේ අයකර ගෙන නොතිබුණි. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 5/2014 හා 2014 ඔක්තෝබර් 25 දිනැති චක්‍රලේඛය | 2016 අගෝස්තු 01 දින සිට සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන මාසිකව රු.15,000 ක දීමනාවක් ගෙවමින් පුස්තකාල කටයුතු හා පිළිගැනීමේ අංශයේ කටයුතු පවරා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,343,789 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,062,820 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.681,557 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා රු.7,857,686 ක් වූ ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 82 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් හිඟ හිටිව තිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු රු. 7,681,557 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කාර්යසාධන ඇගයීම**

------------------------

(අ) 2011 වර්ෂයේ ගම නැඟුම වැඩසටහන යටතේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා වෙන්වූ ප්‍රතිපාදන වලින් මිලදී ගෙන සභාව යටතේ ඇති සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන සඳහා බෙදාහැරීම පිණිස 2013 වර්ෂයේ දී සභාව වෙත උපකරණ ලබාදී තිබුණි. එම උපකරණ වලින් සියයට 75 කට ආසන්න ප්‍රමාණයක් සභාව තුළ රඳවා ගෙන තිබුණි.

(ආ) මහජන උපයෝගීතාවය අරමුණු කරගෙන සභා පරිශ්‍රය තුළ එක් රූපවාහිනී යන්ත්‍රයක් ස්ථාපිත කිරීම ප්‍රමාණවත් වුවද, සභා පරිශ්‍රය තුළ රූපවාහිනී යන්ත්‍ර 06 ක් ස්ථාපිත කර තිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

(අ) 1993 සැප්තැම්බර් 03 දිනට පෙර විශ්‍රාම ගන්වන ලද පළාත් පාලන සේවකයන්ගේ විශ්‍රාම වැටුප් වෙනුවෙන් ගෙවිය යුතු රු.574,858 ක් 2016 දෙසැම්බර් 30 දින වන විටත් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙන ලද කොඩි කණු වලින් රු.62,000 ක් වූ කොඩි කණු 56 ක් 2014 වර්ෂයේ දී උප සභාපති ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 04 දෙනෙකු වෙත නිකුත් කර තිබුණද, ඒවා ආපසු භාර නොතිබූ අතර, උක්ත මන්ත්‍රීවරුන් නිකුත් කරන ලද කොඩි කණු වලට අමතරව රු.55,357 ක් වටිනා කොඩි කණු 50 ක ඌණතාවයක් විය.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

සභාවට අයත් ඌව වෙල්ලස්ස වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 4 ක බදු ගිවිසුම් 2009 අගෝස්තු 31 හා 2016 ජනවාරි 31 දින වන විට අවසන් වී තිබුණු නමුත් 2016 දෙසැම්බර් 30 දින වන විටත් එම ගිවිසුම් අළුත් කිරීමට හෝ දේපල සභාවට නැවත පවරා ගැනීමට කටයුතු කිරීමකින් තොරව මාසික කුලී අයකරමින් තිබුණි.

3.4 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

2014 දෙසැම්බර් 17 දින සභාවට ලැබී තිබූ වටිනාකම රු.16,632,064 ක් වූ වාහන 03 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව ගාල්කර තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2016 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලනය**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) ආදායම් අයකර ගැනීම